# ලංකා බැංකු සේවක සංගමය
# இலங்கை வங்கி ஊழியர் சங்கம்
# CEYLON BANK EMPLOYEES' UNION

ලියාපදිංචි අංකය
பதிவு இல :1151
**Registered No**

අංක 20, පන්සල පාරධ කොළඹ 10. இல. 20, பன்சல வீதி, கொழும்பு 10, No. 20, Temple Road, Colombo 10
දුරකථන /தொலைபேசி/ Telephone:011-2693811/011-2674840, ෆැක්ස් /தொலைநகல்/ Fax: 011-2674840
E.Mail : cbeu@sltnet.lk, cbeu1@sltnet.lk, Web - www.cbeu.lk


(අභ්‍යන්තර විවරණිකාව - සාමාජිකයින් අතරේ පමණයි)

ප්‍රිය සහෝදරය/සහෝදරිය

පී.යු.2019/38

# බැංකු සේවකයාගේ යහපත වෙනුවෙන්
# සංගමය අවදියෙන්

සේවක ණය පොලී හා සුහසාධන ප්‍රතිලාභ මත බදු අයකිරීමට එරෙහිව සහ රාජ්‍ය බැංකුවල පවතින විශ්‍රාම ක්‍රමයන්හි ගැටලු නිවැරදි කිරීම මෙන්ම මෙතෙක් විශ්‍රාමය අහිමි බැංකු සේවකයින්ට සිය සැඳෑ සමයේ ජීවත්වීමට සරිලන විශ්‍රාම යෝජනා ක්‍රමයක් ස්ථාපිත කරගනු පිණිස ලංකා බැංකු සේවක සංගමය විසින් 2019 වසරේ මැද භාගයේ දී දිවයින පුරා වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අතිසාර්ථක ලෙස දියත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 ජුනි මස 20 වන දින මුදල් අමාත්‍යංශය විසින් සංගමයට සාකච්ඡාවක් ලබාදෙන ලදී. එසේම පවතින තත්වය පිළිබඳව එවකට ජනාධිපති, අගමැති සහ විපක්ෂ නායකවරයා දැනුවත් කිරීමට ද සංගමය කටයුතු කළ අතර විපක්ෂ නායක කාර්යාලයේ දී පැවැත්වුණු සාකච්ඡාව අතිශය ඵලදායී එකක් විය. එහිදී රටේ අනාගතය වෙනුවෙන් සංගමයේ යෝජනාවලිය විපක්ෂ නායකවරයා වෙත පිළිගැන්වුණු අතර සංගමය ඉදිරිපත් කළ කරුණු පිළිබඳව සලකා බැලු එතුමා ලාංකීය බැංකු ක්ෂෙත්‍රයට බලපාන පොදු කරුණු සම්බන්ධයෙන්, විශේෂයෙන්ම රාජ්‍ය බැංකු පෞද්ගලීකකරණයට එරෙහිව මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා සිය ස්ථාවරය රටටම හෙළිදරව් කර සිටින ලදී. **එසේම සංගමය ඉදිරිපත් කළ විශ්‍රාමය ඇතුළු යෝජනා බොහොමයක් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශණයෙහි අන්තර්ගත කිරීමට ද කටයුතුකර තිබීම සමස්ත සාමාජිකත්වයම ලද ජයග්‍රහණයක් ලෙස සලකමු.**

## මුදල් අමාත්‍යංශ කමිටුවේ වත්මන් තත්වය

සංගමය විසින් දිවයින පුරා පවත්වන ලද වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් එවකට මුදල් අමාත්‍යවරයාගේ මැදිහත්වීමෙන් විශ්‍රාමය සහ බදු ඇතුළු මෙම ගැටලු විසඳීම සඳහා අමාත්‍යංශ බලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුතු විශේෂිත කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව සංගමය සහ බැංකුවල ප්‍රධානීන් සමග වෙන වෙනම සාකච්ඡා වට කීපයක්ම මේ වනවිට සාර්ථකව පවත්වා ඇත.

- ✧ **සේවක සුහසාධන ප්‍රතිලාභ මත උපයන විට බදු අයකිරීම වැලැක්වීම සඳහා** නව ආදායම් බදු පනතේ පවතින ප්‍රතිපාදන සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ සහ රාජ්‍ය

මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණයන් සහ එකඟතාවන් ලබා ගැනුණු අතර 2019 ජූලි මස 09 වන දින ප ව 03.00 ට එම හමුවීම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

සංගමයේ ඉල්ලීම් පිළිබඳව සලකා බැලූ අමාත්‍යංශ කමිටුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග පැවති එම සාකච්ඡාවෙන් පසුව නිවාස ණය සහන පොළියෙන් 50% දක්වා නිදහස්කර තිබූ උපයන විට ගෙවීමේ බද්ද (PAYE Tax) 75% දක්වා අන්තර්කාලීනව නිදහස් කිරීමට එකඟතාව පළ කරන ලදී. එසේම සංගමයේ ඉල්ලීම වන නිවාස ණය සහන පොලිය 100% ක්ම බද්දෙන් නිදහස් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ඉදිරියේ දී යහපත් වූ තීරණයන් ලබාදීමට ද කටයුතු කරන බවට පොරොන්දු විය. අනෙකුත් සුභසාධන මත අය කෙරෙන බදු ද ඒ සමගින් ඉවත්කර ගැනීම පිණිස සුභවාදී ප්‍රවේශයක් නිර්මාණය වූ බව අපගේ විශ්වාසයයි.

✧ **1996 න් පසු රාජ්‍ය බැංකුවලට බැඳුණු අයගේ විශ්‍රාම ගැටලුව විසඳීම සම්බන්ධයෙන් සංගමය ඉදිරිපත් කළ පහත සඳහන් යෝජනා ඉතා ගැඹුරින් සාකච්ඡාවට භාජනය විය.**

(1) විශ්‍රාම භාර ඔප්පුවේ සඳහන් විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා ගනු ලබන උපරිම වාර්ෂික දළ වැටුප් වැඩිවීම 6.5% සීමාවකට යටත් වී තිබීමේ කොන්දේසිය ඉවත් කිරීම. (විශ්‍රාම සටනේ ඉතිහාසය පිළිබඳව හොඳින්ම මතකයේ ඇති සහෝදර සහෝදරියන්ට මෙම 6.5% නිර්ණායකය පැමිණියේ කෙසේදැයි අමුතුවෙන් සිහිපත්කර දිය යුතු නැතැයි සිතමු.)

2 දැනට පවතින වසර 10 ක සේවා කාලයක් සපුරන සේවකයන්ගේ විශ්‍රාම වැටුප 10% යන සීමාව සේවකයා හෝ සේවිකාව අවසන්වරට ලබාගත් දල වැටුපෙන් 60% ක් දක්වා විය යුතු බවත්, එම සීමාව අවුරුදු 20 දක්වා එලෙසම පවත්වාගෙන ගොස් ඉන් පසු වැඩිවන සෑම වසරකටම විශ්‍රාම වැටුප් ප්‍රතිශතය 1% බැගින් වැඩි කිරීම.

3 මෙම විශ්‍රාම වැටුපට හිමිකම් කියන සේවකයෙක් හෝ සේවිකාවක් විශ්‍රාම යන මොහොතේ දී ඔහු හෝ ඇය ලබන විශ්‍රාම වැටුප මෙන් 24 ගුණයක මුදලක් විශ්‍රාම පාරිතෝෂිකය ලෙස පිරිනැමීම (Commuted Pension)

විශ්‍රාම යෝජනා ක්‍රමයක් ස්ථාපිතකර ඇති රාජ්‍ය බැංකු 3 ට සහ විශ්‍රාම යෝජනා ක්‍රමයක් දැනට ක්‍රියාත්මක නොවන අනෙකුත් රාජ්‍ය බැංකුවලට මෙම තත්වයන් වෙන වෙනම වාර්තා කර සිටීමේ වැදගත්කම සංගමය විසින් කමිටුව වෙත පෙන්වා දෙන ලදී.

එහිදී කමිටුව විසින් විශ්‍රාමය ක්‍රියාත්මකව ඇති රාජ්‍ය බැංකු තුනෙහි කළමනාකාරිත්වයන් සහ අනෙකුත් රාජ්‍ය බැංකුවල කළමනාකාරිත්වයන් අදියර 2 ක් යටතේ කමිටුව වෙත කැඳවූ අතර, ඒ අනුව කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා 2019-08-06 දිනැතිව කමිටුවේ සභාපතිවරයා වන මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ අත්සනින් යුතුව විශ්‍රාමයක් ක්‍රියාත්මක රාජ්‍ය බැංකුවල සභාපතිවරුන් වෙත සංගමයේ විශ්‍රාම යෝජනා ඇතුළත් කරමින් ලිපි යොමුකර ඇත. ඊට ධනාත්මක ප්‍රතිචාර දක්වමින් එම බැංකුවල ප්‍රධානීන් මේ වනවිට එම යෝජනා ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව අවශ්‍ය ගණනය කිරීම් සිදුකර වාර්තා කරන බවට කමිටුව දැනුවත් කර ඇත.

එමෙන්ම 2 වන අදියර යටතේ 2019-08-07 දිනැතිව විශ්‍රාම යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර නොමැති ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB), රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB) සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC) යන බැංකුවල සභාපතිවරුන් වෙත ද කමිටුව විසින් ලිපි යොමුකර ඇත. එම රාජ්‍ය බැංකුවල සේවකයින් සඳහා පිළිගත හැකි විශ්‍රාම යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර ගැනීමට ඇති හැකියාව මෙන්ම සංගමය විසින් කමිටුව වෙත ලබාදී ඇති විශ්‍රාම යෝජනා පිළිබඳව ඔවුන්ගේ නිරීක්ෂණයන් ලබාදීමට ද අවස්ථාව එමගින් හිමි වී ඇත. මෙම සියලු කටයුතු සිදුවූයේ දේශපාලන නියෝජිතයින් සමග නොව මුදල් අමාත්‍යංශයේ සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරින්ගෙන් සැදුම්ලත් කමිටුවක් සමග බව ඉතා වගකීමෙන් යුතුව ප්‍රකාශකර සිටිමු.

ලංකා බැංකු සේවක සංගමය අඛණ්ඩව ගෙනගිය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස නව විශ්‍රාම අරමුදල සම්බන්ධයෙන් එම කමිටුව විසින් බැංකුවල කළමනාකාරිත්වයෙන් සිදුකළ විමසීම්වලට අනුගත වෙමින් මේ වනවිට ප්‍රධාන බැංකුවල පවතින නව විශ්‍රාම අරමුදල්හි ශක්‍යතාව පිළිබඳව ආයුගණක වාර්තා කැඳවා ඇති අතර එම වාර්තා අමාත්‍යංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව සංගමයේ යෝජනා ක්‍රියාත්මක කරවා ගැනීමට හැකිවනු ඇති බව සංගමයේ විශ්වාසයයි. මෙම යහපත් ප්‍රවණතාව විශ්‍රාමය දිනා ගැනීම පිණිස මෙතෙක් පැමිණි ගමන් මගෙහි වූ සුවිශේෂී සන්ධිස්ථානයක් සේ සැලකිය හැකිය.

## නොවැම්බර් 21 විධායක සභා තීන්දුව මුදල් අමාත්‍යංශයට

විශ්‍රාමය සම්බන්ධයෙන් සංගමයේ යෝජනා ක්‍රියාත්මක වූ පසු නව විශ්‍රාමය ද ඉතා ඵලදායී විශ්‍රාම යෝජනාවලියක් බවට පත්වන අතර පැරණි විශ්‍රාමයේ සේවකයින් අද භුක්ති විඳින ප්‍රතිලාභ ඒ අයුරින්ම හෙට දවසේ දී නවක සේවක ප්‍රජාවට ද හිමිකර ගැනීමට ඉඩ ලැබෙනු ඇත. **කෙසේ වුව ද ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති පරිදි පැරණි විශ්‍රාමය නවක සේවකයින්ට ද හිමිවන්නේ නම් එය අපගේ අවසානාත්මක අරමුණ ජයග්‍රහණය කිරීම වන අතර ඒ වෙනුවෙන් අප එදා මෙන්ම අදත් හෙටත් අවංකව පෙනී සිටින බව දන්වමු.** සංගමයේ එකම අභිලාෂය සේවකයාගේ දායකත්වයෙන් තොර පරිපූර්ණ විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් බැංකු ක්ෂේත්‍රය තුළ ස්ථාපිතකර ගැනීමයි. ඒ අනුව නොවැම්බර් 21 වන දින පැවති විධායක සභාවේ දී මුදල් අමාත්‍යංශ කමිටුවේ මේ දක්වා තත්වය හා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු පොරොන්දුව ද ඇතුළත් කරමින් වහාම මුදල් අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යංශ බලධාරීන් හා සාකච්ඡාවක් ඉල්ලා සිටීමටත්, ඒ හා සමගම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ බැංකු සේවකයින්ට බලපානු ලබන විශ්‍රාමය, උපයනවිට බදු වැනි කාරණා ඉක්මණින් ක්‍රියාත්මක කර ගැනීම සඳහා ජනාධිපතිතුමා වෙත දැනුම් දීමටත් තීරණය විය.

තවද නිශ්චිත කාල සීමාවන් තුළ මෙම ගැටලු දෙක සඳහා විසඳුම් නොලැබෙන්නේ නම් අවශ්‍ය සුදුසු පියවර ගැනීම සඳහා නිලධාරී මණ්ඩලයට බලය පවරන ලදී. නොවැම්බර් 28 දින පැවැත්වීමට නියමිත සංගමයේ මධ්‍යම කාරක සභාවේ දී මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කිරීමට නියමිතව ඇත.

දේශපාලන නායකත්ව පෙරලියෙන් පසු පුරුදු පරිදි හිටිහැටියේම අවදි වී ප්‍රමෝද වූ දේශපාලන ජුන්ටාවන් අතිගරු ජනාධිපතිතුමාගේ බාප්පොච්චිලා සේ හැසිරෙමින් කුමන කයිවාරු ගැසුවත් සත්‍යය යටපත් කළ නොහැක. බැංකු සේවකයාගේ යහපත වෙනුවෙන් වචනයෙන් නොව ක්‍රියාවෙන් සංගමය සැමවිටම කටයුතුකර ඇති බවටත්, කුමන අභියෝග පැමිණිය ද ඒවා අවස්ථාවන් බවට පරිවර්තනය කර ගනිමින් ඉදිරියටත්

සාමාජික ශක්තියෙන් සියලු අභියෝගයන් ජයගන්නා බවටත් සමස්ත සාමාජිකත්වය වෙත වාර්තාකර සිටිමු.

ජයග්‍රහණවලට පියවරු රැසක් සිටිය හැකි වුව ද සැබෑ කැපවීමෙන් දුෂ්කරතා විඳිමින් බැංකු සේවකයාගේ යහපත වෙනුවෙන් ලංකා බැංකු සේවක සංගමය සිදුකරන පියෙකුගේ මෙහෙවර සම්බන්ධව බහුතර සාමාජිකත්වය හොඳින්ම දැනුවත් බව ද අපි දනිමු. එබැවින් බොරු බේගල් පවසමින් බැංකු සේවකයින්ව නොමග යැවීමට උත්සාහ කරන දේශපාලන කණ්ඩායම්වලට නොරැවටෙන ලෙසට දන්වා සිටිමු. සැම විටම සත්‍යය එළිදරව් කිරීමට සහ ක්‍රියාවෙන් නිසි පිළිතුරු දීමට සංගමය සූදානම් බව ද සමස්ත සාමාජිකත්වය වෙත වාර්තාකර සිටිමු.

## **මේ අපේ ජය භූමියයි !**

## **ලංකා බැංකු සේවක සංගමය දිගුකල් දිනේවා !**

මෙයට - සහෝදරත්වයෙන්





***චන්න දිසානායක***
සභාපති

***රන්ජන් සේනානායක***
ප්‍රධාන ලේකම්

2019 නොවැම්බර් මස 26 වන දින

**FLASH**

***රාජ්‍ය බැංකුවලට සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීමේ දී ස්ථාපිතව ඇති ආයතනික යහපාලන ප්‍රතිපාදනයන්ට අනුකූලව පිළිගත් වෘත්තිකයින් පත් කරන ලෙස අප සංගමය දිගින් දිගටම පැවති ආණ්ඩුවලින් ඉල්ලීම්කර ඇති අතර එය අපගේ පසුගිය නියෝජිත සම්මේලනයේ දී යෝජනාවක් ලෙස සම්මත කර සියලු වගකිවයුතු පාර්ශව වෙත දැනුම් දී ඇත. නමුත් ඒ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු වූ බවක් පසුගිය කාලය තුළ දක්නට නොලැබිණි.***

***කෙසේ වුව ද මෙවර ජනපතිවරණයෙන් පසු රාජ්‍ය බැංකු ඇතුළු රාජ්‍ය ආයතන සඳහා සභාපතිවරු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම විද්වත් කමිටුවක් හරහා සිදු කිරීමටත්, ඒ සඳහා සුදුසුකම් ඇති වෘත්තීකයින් පත් කිරීමටත් පියවර ගෙන ඇති බව වාර්තාවන බැවින් එය ප්‍රශංසනීය තත්වයක් ලෙස අගයකර සිටිමු. තවද එම ප්‍රතිපත්තිය ඒ ආකාරයෙන්ම ක්‍රියාවට නැංවීම සඳහා ඒ වෙනුවෙන් සැමදා පෙනී සිටි වෘත්තීය සංගමයක් ලෙස අදාළ විද්වත් කමිටුව වෙත අපගේ ලිඛිත කරුණු දැක්වීම් සිදු කිරීමට ද කඩිනම් පියවර ගන්නා බව දන්වමු.***